## 13 වන පරිච්ඡේදය

# භූගෝලීය ලක්ෂණ හා සුවිශේෂ පිහිටීම සිතියම ලකුණු කිරීම

භූගෝල විද්‍යාත්මක ව වැදගත් කරුණු හා රට සම්බන්ධ ස්ථාන, ප්‍රදේශ, නැතහොත් ලෝකයේ භෞතික, ආර්ථික හා සංස්කෘතික ලක්ෂණවලට සම්බන්ධ තොරතුරු ලෝක ආකෘති සිතියමක ලකුණු කර නම් කිරීමේ හැකියාව භූගෝල විද්‍යාඥයින්ට තිබිය යුතු ය. භූගෝල විද්‍යාව විෂය ඇගයීම් කාර්යයන් හි දී සිතියම් ලකුණු කිරීම පිළිබඳ ඔබගේ කුසලතා මැන බැලීම සඳහා ප්‍රශ්න සකස් කරනු ලැබේ. එහෙයින් සිතියම් ලකුණු කර නම් කිරීම පිළිබඳ නිපුණතාවක් ඔබ තුළ වර්ධනය කර ගත යුතු ය. ඒ සඳහා නිරන්තරයෙන් ම සිතියම් ලකුණු කිරීමේ අභ්‍යාසවල නිරත විය යුතු යි.

## ලෝක සිතියම් ලකුණු කිරීම සඳහා තෝරා ගනු ලබන අංශ

- අක්ෂාංශ

සමකය, කර්කටක නිවර්තනය, මකර නිවර්තනය, ආක්ටික් වෘත්තය, ඇන්ටාක්ටික් වෘත්තය ආදී වැදගත් අක්ෂාංශ

- දේශාංශ

ග්‍රිනිච් දේශාංශය ($0^0$ දේශාංශය), බටහිර $90^0$ දේශාංශය, නැගෙනහිර $80^0$ දේශාංශය, $180^0$ දේශාංශය

- භෞතික ලක්ෂණ

| | | |
|---|---|---|
| ප්‍රධාන කඳු වැටි | - | රොකි, ඇන්ඩීස්, හිමාලය, යුරල්, කොකේසස් |
| සානු | - | ඩෙකෑන්, ටිබෙට්, මොංගෝලියානු |
| සුවිභේද නිම්න | - | රයින් සුවිභේද නිම්නය |
| විල් | - | සුපීරියර්, මිචිගන්, හියුරන්, ඊරි, ඔන්ටේරියෝ, ටැංගනිකා, ලැඩෝගා |
| ප්‍රධාන ගංගා | - | මිසූරි, මිසිසිපි, ඇමසන්, කොංගෝ, නයිල්, නයිජර්, සැම්බීසි, මරේඩාලිං, ඩැනියුබ්, රයින්, පෝ නදිය, ගංගා නම් ගඟ, සින්ධු ගඟ, නර්මදා, තජ්ති ආදී ගංගා |
| ▸ මුහුදු | - | මධ්‍යධරණී, කැරිබියන්, උතුරු මුහුද, ජපන් මුහුද, මළ මුහුද, සුදු මුහුද, බණ්ඩා මුහුද ආදිය |

වෙරළාශ්‍රිත ලක්ෂණ

| | | |
|---|---|---|
| සාගරික වැටි | - | මධ්‍ය අත්ලන්තික් සාගර වැටිය, කාල්ස්බර්ග් වැටිය, දකුණු මධ්‍ය අත්ලන්තික් වැටිය, අත්ලන්තික්-ඉන්දියානු වැටිය. |
| සාගර ආගාධ | - | මරියානා, මින්ඩනාඕ, ජාවා ආගාධ |
| දිය වැල් | - | අගුල්හාස්, බෙංගුවෙලා, හම්බෝල්ට්, කුරෝෂියෝ, ගල්ෆ්, කැලිෆෝනියා ප්‍රවාහය ආදිය |
| බොක්ක | - | බිස්කේ, පැනමා, කාපෙන්ටේරියා, හඩ්සන්, බෙංගාල බොක්ක |
| අර්ධද්වීප | - | යුකටන්, සිනායි, කැම්චැට්කා, බෝල්කන්, අයිබීරියන් අර්ධද්වීපය |
| සමුද්‍ර සන්ධි | - | ජිබ්‍රෝල්ටා, මලක්කා, බීරිං, පෝක්, මැගලන්, කුක්, ටෝරස්, ඩේවිස්, ඩෙන්මාර්ක් ආදී සමුද්‍ර සන්ධි |
| දේශගුණික ප්‍රදේශ | - | උෂ්ණ කාන්තාර - නිවර්තන වර්ෂා වනාන්තර දේශගුණය<br>ශීත කාන්තාර - තුන්ද්‍රා දේශගුණික ප්‍රදේශ<br>මෝසම් ප්‍රදේශ |
| වෘක්ෂලතා කලාප | - | නිවර්තන වැසි වනාන්තර - සෞම්‍ය කලාපීය වනාන්තර<br>කේතුධර වනාන්තර - සැවානා තණබිම්, මධ්‍යධරණී වෘක්ෂලතා කලාප |
| කෘෂිකාර්මික ප්‍රදේශ | - | මධ්‍යධරණී කෘෂිකාර්මික ප්‍රදේශය - ඇමරිකා එක්සත් ජනපදයේ තිරිඟු වගා තීරුව<br>ඕස්ට්‍රේලියාවේ කිරිපට්ටි පාලන ප්‍රදේශය |

කාර්මික ප්‍රදේශ - ලෝකයේ යකඩ හා වානේ ප්‍රදේශ, ඛනිජතෙල් නිෂ්පාදන ප්‍රදේශ, මෑතක දී කාර්මික වූ රටවල්, අධිතාක්ෂණික කර්මාන්ත ප්‍රදේශ

ජන සංඛ්‍යාව ආශ්‍රිත තොරතුරු - ලෝකයේ ජනාධික ප්‍රදේශ, ජන හීන ප්‍රදේශ, ලෝකයේ දශ ලක්ෂ නගර

ප්‍රවාහන මාර්ග - මහා සයිබීරියන් දුම්රිය මාර්ගය වැනි ප්‍රධාන දුම්රිය මාර්ග, ගුවන් මාර්ග හා ප්‍රධාන නැව් මාර්ග ආදිය

කාලීන ව වැදගත්වන දේ - කාලීන ව වැදගත් වන තොරතුරු පිළිබඳ ව අවධානය යොමු කිරීම ද වැදගත් ය. භූමිකම්පා, නායයාම්, ජලගැලීම්, ලෝක සම්මේලන ආදී නිදසුන් ය.

ප්‍රධාන නගර - ලන්ඩන්, නිව්යෝර්ක්, පැරිස්, පීනිවා, සියැටල්, සන්තියාගෝ, බොම්බාය, කයිරෝ, නව දිල්ලිය, මදුරාසිය, ඔසාකා, කාබුල්, ඔටාවා, හැනෝයි, හරාරේ, කේප්ටවුන්, සිංගප්පූරුව.

මෙවැනි ස්ථාන, නගර, ප්‍රදේශ ආදිය ලෝක සිතියම්වල ලකුණු කර නම් කිරීමේ දී පිළිගත් සම්මතයන් ඇත.

## ලෝක සිතියම් ලකුණු කිරීමේ දී සැලකිය යුතු කරුණු

ඇට්ලස් සිතියම් පොත්වල භාවිත කරන පිළිගත් වර්ණ හා සංකේත ඇත. ඒවා ගැන පැහැදිලි අවබෝධයක් ඔබ ලැබිය යුතු යි.

| | | |
|---|---|---|
| උදා:- නගර | - | රතු පාටින් |
| කඳු වැටි | - | දුඹුරු පාටින් |
| ගංගා හා ජලාශ, මුහුදු | - | නිල් පාටින් |
| උෂ්ණත්වය: උෂ්ණාධික ප්‍රදේශ | - | තද රතු පාටින් |
| වනගත ප්‍රදේශ | - | කොළ පාට හා ලා කොළ පාට |
| ජනාධික ප්‍රදේශ | - | රතු පාට |
| ජන හීන ප්‍රදේශ | - | කහ පාට |
| උෂ්ණ දියවැල් | - | ගලන දිශාව දක්වන රතු පාට ඊතලවලින් |
| ශීත දියවැල් | - | ගලන දිශාව දක්වන නිල් පාට ඊතලවලින් |

සිතියම්වල කඳුවැටි, ගංගා, මායිම් රේඛා ආදියෙහි නම් පිළිවෙළින් කඳු වැටිය, ගංගා, සහ මායිම් රේඛාව දිගේ ලියා දක්වනු ලැබේ. නගර ස්ථාන නාම, ප්‍රදේශ නාම ආදිය හැම විට ම තිරස් අතට ලිවීම සාමාන්‍ය ස්වභාවය යි. ඇට්ලස් පොත් පරිහරණය කිරීමෙන් මේ පිළිබඳ ව ඔබගේ අවබෝධය වැඩි දියුණු කර ගත හැකි ය.

## සිතියම් ලකුණු කිරීමේ දී සිදු විය හැකි ප්‍රමාද දෝෂ

සිතියම් ලකුණු කිරීමේ දී සිදු විය හැකි අඩු පාඩු රාශියක් හඳුනා ගෙන ඇත.

උදා:-
- ❑ නගරයක් ලකුණු කිරීමේ දී රතුපාට තිතකින් ස්ථානගත නො කිරීම.
- ❑ වෙරළාසන්නයේ නගරයක් ලකුණු කිරීමේ දී මුහුදු ප්‍රදේශයේ නගරය ස්ථානගත කිරීම.
- ❑ ගංගාවක් දැක්වීමේ දී ගංගාව මුහුදට සම්බන්ධ නො වීම හා අතු ගංගා ප්‍රධාන ගංගාවට සම්බන්ධ නො වීම.
- ❑ ගංගාවේ ආරම්භය හා අවසානය එක ම ප්‍රමාණයේ රේඛාවකින් ලකුණු කිරීම.
  (ගඟ ආරම්භයේ දී සිහින් රේඛා සටහන් තිබිය යුතුය.)
- ❑ රටක් හෝ ප්‍රදේශයක් ලකුණු කිරීමේ දී එහි සීමාවන් නො දැක්වීම.
  (රාජ්‍ය සීමා බෙදා ඇති සිතියම්වල දී මෙය ගැටලුවක් නොවේ).
- ❑ අදාළ ස්ථානයේ අකුරු ලිවීමට ඉඩ කඩ ප්‍රමාණවත් නො වන විට රට ඇතින් ලියා ඊතලයකින් දැක්විය හැකි ය. ඊතලයේ තුඩ අදාළ ස්ථානය, ප්‍රදේශය හෝ රාජ්‍යය දෙසට දක්වා තිබිය යුතු යි. සමහරු ඊතලයේ තුඩ දක්වා තිබෙන්නේ නම දෙසට ය. එය වැරදි ය.